# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2049/59 – 2017 දෙසැම්බර් මස 15 වැනි සිකුරාදා - 2017.12.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (1) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

**2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත**
**3 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ වූ නියමය**

සංශෝධිත 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3 වන වගන්තියේ (4) වන උපවගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ආයෝජන ප්‍රවර්ධන විෂයභාර අමාත්‍යවරයා වන්නාවූ, සංවර්ධන උපාය මාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍ය මලික් සමරවික්‍රම වන මා විසින්, 2014 ජූලි මස 04 දින අංක 1974/7 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය යටතේ 3 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ පළකරන ලද නියමයන් මගින් සංශෝධිත 2012 දෙසැම්බර් 19 වන දින අංක 1789/22 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය යටතේ 3 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ පළකරන ලද නියමයට අතිරේක වශයෙන් තවදුරටත්, මෙම නියමය මගින් පහත දැක්වෙන පරිදි ප්‍රකාශයට පත්කරමි; එනම්

2016 ජූලි 04 දින අංක 1974/7 දරන *අතිවිශේෂ ගැසට් පත්‍රය* යටතේ 3 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ පළකරන ලද නියමය මගින් සංශෝධිත 2012 දෙසැම්බර් 19 දින අංක 1789/22 දරන *අතිවිශේෂ ගැසට් පත්‍රය* යටතේ පළකරන ලද නියමයේ (4) වන වගන්තිය, ව්‍යාපෘතිය ආරම්භ කිරීම සඳහා ප්‍රදානය කරන ලද කාලසීමාව දීර්ඝ කිරීමේ අරමුණින් පහත දැක්වෙන ලෙස කියවෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:- .

> ''(4) බස්නාහිර පළාතේ කොළඹ 3 ගාලුපාර අංක 116 දරන ස්ථානයේ සේවා මහල් නිවාස 90ක් සහිත කාමර 475කින් සමන්විත නගර හෝටලයක් ඉදිකර පවත්වාගෙන යෑම සඳහාවූ ව්‍යාපෘතිය 2012 ජූලි 19 දින ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග ව්‍යාපෘති ගිවිසුම අත්සන් කරනු ලැබූ දින සිට 2018 දෙසැම්බර් 31 දිනයෙන් අවසන්වන මාස හැත්ත හතක (77) කාලසීමාවක් තුල දී වාණිජ මෙහෙයුම් කටයුතු ආරම්භ කරනු ලැබිය යුතුය.''

**මලික් සමරවික්‍රම,**
සංවර්ධන උපාය මාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍ය.

2017 දෙසැම්බර් මස 14 දින.

12 - 1075